# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP)

# ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

## ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු - තනතුරු 01

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP) යනු ලෝක බැංකු (WB) මූල්‍ය ප්‍රතිපාදන යටතේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 150 ක් වන අතර, එය 2024-2028 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක පුරා ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල ප්‍රවේශය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම වෙනුවෙන් සැලසුම් කර ඇත. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

<table>
<tr><th colspan="4">ව්‍යාපෘති වටිනාකම – ඇමරිකානු ඩොලර් මිලියන 25 ට වැඩි සහ ඇමරිකානු ඩොලර් මිලියන 200 ට අඩු</th></tr>
<tr><th>තනතුර</th><th>තනතුරු ගණන</th><th>කාණ්ඩය (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අංක 01/2019 චක්‍රලේඛයට අනුව)</th><th>සුදුසුකම්</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු</td><td>01</td><td>C කාණ්ඩය</td><td>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු හෝ ඊට සමාන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 08 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.<br>හෝ<br>2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු හෝ ඊට සමාන ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක කළමනාකරණ මට්ටමේ පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.<br>හෝ<br>3. රජයේ ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන තත්ත්වයක සිටින නිලධාරියෙකු වීම සහ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ I ශ්‍රේණියේ තනතුරක හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 02 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.</td></tr>
</table>

**නියමයන් සහ කොන්දේසි:**

- වේතනය, නියමයන් සහ කොන්දේසි **2026 මාර්තු 28 දිනැති අංක 02/2026** දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට සහ එහි වරින් වර සිදුවන සංශෝධනවලට යටත්ව වේ.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස **අවුරුදු 64 ට** අඩු විය යුතුය.
- පත්වීම වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර, සතුටුදායක කාර්යසාධනය මත පදනම්ව ව්‍යාපෘති කාලය දක්වා දීර්ඝ කළ හැක.
- විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල පූර්ව පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

ව්‍යාපෘති විස්තර සඳහා, කරුණාකර **https://phsep.lk** වෙත පිවිසෙන්න.

අධ්‍යාපන, පළපුරුද්ද සහ අනෙකුත් සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත්, සම්බන්ධ කර ගත හැකි දුරකථන/ෆැක්ස් අංක සහ ඊමේල් ලිපිනය ඇතුළත් සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් (විශේෂිත ආකෘතියක් නොමැත) සහිත අයදුම්පත "ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ඉංජිනේරු තනතුර සඳහා වන අයදුම්පත" ලෙස ලිපි කවරයේ සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2026 අගෝස්තු 31** දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට යොමු කළ යුතුය.

**ලිපිනය:**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP),**
**191 A, "බංගලාව",ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය,**
**ධර්මපාල මාවත, කොළඹ 07.**

**විද්‍යුත් තැපෑල : info@phsep.lk**
**දුරකථන : 0112 271150**

**සැලකිය යුතුයි :** අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද, කුසලතා සහ නිපුණතා සපුරා නොමැති, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, සනාථ කරන ලියකියවිලි අමුණා නොමැති සහ ලියාපදිංචි තැපැල හැර වෙනත් ක්‍රමවලින් (විද්‍යුත් තැපැල, අතින් ගෙනැවිත් දීම හෝ වෙනත් ලිපිනයකට යොමු කිරීම) එවනු ලබන අයදුම්පත් සලකා බලනු නොලබන අතර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (PHSEP).**
**2026 අගෝස්තු 17**